Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 08

**පාඩම :- සංඛ්‍යා රේඛාව ( 1 වන සතිය)**
**කාලච්ඡේද ගණන :- 11**

- පෙළපොතේ 61, 62 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.
- විවිධ කටයුතුවලදී අප භාවිතා කරන සංඛ්‍යා සලකුණු කරන ලද මිනුම් උපකරණ 5 ක් ලියන්න.
- පෙළපොතේ 62 පිටුවේ ක්‍රියාකාරකම 1 නිවැරදිව අධ්‍යයනය කරන්න.


1. සංඛ්‍යා රේඛාවක් යනු කුමක්ද?
2. සංඛ්‍යා රේඛාවක තිබිය යුතු ලක්ෂණ ලියන්න.
3.

**සංඛ්‍යා රේඛාවක සංඛ්‍යාවල අගය දකුණු දෙසට ක්‍රමයෙන් වැඩිවේ.**

පහත දැක්වෙන සංඛ්‍යා, සංඛ්‍යා රේඛාව මත සලකුණු කරන්න.

උදා:-


A = 2    B = 4    C = 5    D = 7




| | | | |
|---|---|---|---|
| 1) | P = 1 | Q = 3 | R = 6 |
| 2) | X = 0 | Y = 4 | Z = 7 |
| 3) | A = 1 | B = 5 | C = 8 |


- පෙළපොතේ 63 පිටුව බලන්න. නිදසුන 1 නිවැරදිව අධ්‍යයනය කරන්න.
- 5.1 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 64 පිටුවේ ක්‍රියාකාරකම 2 නිවැරදිව අධ්‍යයනය කරන්න.

- සංඛ්‍යා රේඛාවක් ඇද ධන හා ඍණ සංඛ්‍යා සලකුණු කරන්න.




පහත දැක්වෙන සංඛ්‍යා සංඛ්‍යා රේඛාව මත සලකුණු කරන්න.

A = -3 B = -1 C = 2




| | | | | |
|---|---|---|---|---|
| 1) | P = -5 | Q = -4 | R = -1 | T = 3 |
| 2) | X = -7 | Y = -3 | Z = 0 | |
| 3) | A = -6 | B = -4 | C = -1 | D = 4 |

- පෙළපොතේ 65,66 පිටු බලන්න. නිවැරදිව අධ්‍යයනය කරන්න.
    1) නිඛිල සංඛ්‍යා යනු කුමක්ද?
    2) ධන නිඛිල හා ඍණ නිඛිල නිවැරදිව විස්තර කරන්න.

**බින්දුව ද ඇතුලත්ව සියලු ධන පූර්ණ සංඛ්‍යා හා ඍණ පූර්ණ සංඛ්‍යා නිඛිල නම් වේ.**
**එනම් ........... -3, -2, -1, 0, 1, 2, 3, ..................**

- පෙළපොතේ 66 පිටුව බලන්න. නිදසුන 1 නිවැරදිව අධ්‍යයනය කරන්න.

- පෙළපොතේ 67 පිටුවේ 5.2 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

1) 1 හා 10 අතර ඇති නිඛිල සියල්ල ම ලියන්න.
2) -5 හා 0 අතර ඇති නිඛිල සියල්ල ම ලියන්න.
3) -10 හා -3 අතර ඇති නිඛිල සියල්ල ම ලියන්න.
4) -5 හා +5 අතර ඇති නිඛිල සියල්ල ම ලියන්න.